# වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම් වාර්තාව - 2025.06.26

**පිළිගැනීම**

2025 වර්ෂයේ ජූනි මස 26 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව.09.00ට මුලාසනය දැරූ ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය , සභා ලේකම්තුමා , කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදි මහතුන් ඇතුළු සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

**සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා
2. ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. උදයකුමාර් මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙණිය මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ධනුෂ්ක තිලකසිරි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රසීක් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. දිනිෂා මැතිණිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණි දිසානායක මැතිණිය
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. වසන්ත කුමාරන් මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසීප් මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී. අමිත අමරසූරිය මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චූලනී ජයමාලි මැතිණිය
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා

**නොපැමිණී**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා

**01. පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම .**

ඒ අනුව පහත ආකාරයෙන් සංශෝධනය සටහන් කරන ලදි.

**I. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා**

පසුගිය විශේෂ සභාවාරයේදී යෝජනා අංක 04 යටතේ ගරු සභාපතිතුමා ගෙනා යෝජනාවේදී මා සඳහන් කළේ රු:5000.00 සීමාවට අදාළ සාකච්ඡාව ඊළඟ සභාවාරයේදී සාකච්ඡා කර තීරණයකට එළඹීමට සහ පසුගිය සභාවේදී සභාපතිතුමාට ලබා දී තිබූ වියදම් කිරීමේ සීමාව වන ලක්ෂ දෙක හමාරක මුදල මත කටයුතු කර අද දින සභා වාරයේදී තීරණයක් ගන්නා තෙක් කටයුතු කරගෙන යමු ලෙසයි. එබැවින් එම ඉල්ලීම සංශෝධනයක් ලෙස සටහන් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**II..ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**

03 වැනි පිටුවේ මුදල් කමිටුව සඳහා අංක 16 යටතේ සඳහන් වන මන්ත්‍රීවරයාගේ නම ස්ථිර කරන ලද තීරුවේ ස්ථිර කළේ ගරු මන්ත්‍රී අමිත අමරසූරිය මන්ත්‍රීතුමා විසින්ය. නමුත් මෙහි සඳහන්ව ඇත්තේ ගරු මන්ත්‍රී සිත්ති උසෙයිමා මන්ත්‍රීතුමියගේ නමය. එසේම නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට මම යෝජනා කළේ, ගරු මන්ත්‍රී අමිත අමරසූරිය මන්ත්‍රීතුමාගේ නමය.නමුත් එතැන සඳහන්ව ඇත්තේ ගරු මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසීප් මැතිතුමා නමය. එය සංශෝධනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ඒ අනුව නිවැරදි කිරීම**

| පිටු අංක | මුදල් කමිටුව | යෝජනා කළේ | ස්ථිර කළේ |
|---|---|---|---|
| 03 | අංක 16 යටතේ ගරු මන්ත්‍රී සිසිර දිලාන් මැතිතුමා | ගරු මන්ත්‍රිනි චූලනී ජයමාලි මැතිනිය | ගරු මන්ත්‍රී අමිත අමරසූරිය මැතිතුමා |

| පිටු අංක | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | යෝජනා කළේ | ස්ථිර කළේ |
|---|---|---|---|
| 04 | අංක 11 ගරු මන්ත්‍රී අමිත අමරසූරිය මැතිතුමා | ගරු මන්ත්‍රී සිසිර දිලාන් මැතිතුමා | ගරු මන්ත්‍රිනි චූලනී ජයමාලි මැතිනිය |

**III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා**

පිටු අංක 04 හි අංක 09 යටතේ මන්ත්‍රීවරයාගේ නම ගරු මන්ත්‍රී සිත්ති උසෙයිමා විය යුතු අතර එය යෝජනා කරන ලද්දේ,ගරු මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා විසිනි. එසේම වාර්තාවේ මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වූ මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනයට මගේ නම සඳහන් වි නොමැති අතර එය නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ඒ අනුව නිවැරදි කිරීම**

| පිටු අංක | නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව | යෝජනා කළේ | ස්ථිර කළේ |
|---|---|---|---|
| 04 | අංක 09 ගරු මන්ත්‍රිනි සිත්ති උසෙයිමා මැතිනිය | ගරු මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා | ගරු මන්ත්‍රී ඩී.එම්. පත්මිණි දිසානායක මැතිනිය |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,රෙකෝඩින් කර සහ පසුගිය සභා වාර්තා පරිශීලනය කර නිවැරදි වාර්තාවක් ලබා දිමට කටයුතු කරන ලෙස හා කාරක සභා අවස්ථාවේදි සාකච්ඡා කළ කරුණුද ඇතුළත් කර නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. තවද කාරක සභා අවස්ථාවට පත්කළා යැයි වාර්තාවේ සඳහන් ව ඇති නමුත් එහිදී සාකච්ජා කළ ප්‍රධාන කාරණාව වත් සටහන් වි නොමැති බව මා පවසා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා,**

සංක්ෂිප්ත වාර්තාවක් ලබා දීමේ අරමුණින් මෙම වාර්තාව සකස් කල අතර එහි අඩුපාඩු ඇත්නම් සංශෝධනය කිරීමට හා මෙම වාර්තාවේ අන්තිම ජේදයේ කාරක සභා අවස්ථාවට පත් වූ විට මූලික කාරණාව සඳහන්වී ඇති අතර , කාරක සභා අවස්ථාවේ සියලු කරුණු ඇතුළත් විය යුතු නැති අතර ඔබතුමන්ලාගේ පැත්තෙන් ප්‍රකාශ කළ පරිදි එක් එක් මන්ත්‍රීවරු කථා කළ කරුණු ඇතුළත් කිරීමටත්,ඒ පරිදි වාර්තාවක් ලබා දීමටත් ,කටයුතු කරව බවත්,ඒ අනුව සංශෝධනයන්ට යටත්ව වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2025.06.06 දින මහ සභා වාර්තාව ගරු මන්ත්‍රී ආර්.එම්.ඩී.අයි.රන්දෙණිය මැතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. ගරු සභාපතිතුමා විසින් කරන ලද නිවේදන,**

i) සභාවට අභිනවයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් පත්වී මසක් ඇතුළත වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතු බව දැන්වීම
ii) අංක 2199/25 දරණ 2020 ඔක්තෝබර් මස 29 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ගැසට් පත්‍රය

ඒ අනුව අංක 2199/25 දරණ 2020 ඔක්තෝබර් මස 29 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති 2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 2025 .05.23 දින ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට අවශ්‍ය සංවර්ධන යෝජනා ලබා දෙන ලෙස මහජනතාව දැනුවත් කිරීමේ දැන්වීම දිණමිණ,තිනකරන් හා ඩේලි නිවුස් යන පුවත්පත්වල භාෂාත්‍රයෙන් පල කල බවත්,2026 වර්ෂයේ වියදම් ඇස්තමේන්තුවට හා සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා 2025.06.30 දිනට පෙර ලබා දෙන ලෙසත් නිවේදනය කරනු ලැබීය.

iii) 2025.07.16 වන දින පැවැත්වෙන SLT මොබිටෙල් ආයතනය මඟින් සංවිධානය කර ඇති තොරතුරු තාක්ෂණය පිළබඳ වැඩසටහන සඳහා සහභාගි වන ලෙස දැන්වීම.

ඒ අනුව 2025.07.16 වන දින පැවැත්වෙන SLT මොබිටෙල් ආයතනය මඟින් සංවිධානය කර ඇති තොරතුරු තාක්ෂණය ,මෙහෙයුම් පද්ධතිය,ජාලගත කිරීම වැනි ඩිජිටල්කරණයට අදාළ සියලු සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සහභාගි වන ලෙසට දන්වනු ලැබීය.

**3. සන්නිවේදන ලිපි**

නුවරඑළිය මහ නගර සභාවේ ජලසම්පාදන කටයුතු වැඩිදියුණු කිරිම සඳහා වන අඹේවෙල ජලසම්පාදන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනිමට ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි විසින් යොමු කරන ලද ලිපියේ සඳහන් පරිදි නුවරඑළිය නගරය සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීමේ වැඩසටහනට සමගාමීව නුවරඑළිය නගරයේ ජලසම්පාදනය වැඩිදියුණු කිරීම සඳහා ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ මධ්‍යම ප්‍රාදේශීකය මගින් කර ඇති මූල්‍ය සක්‍රීයතා අධ්‍යයන කටයුතු මේවන විට අවසන් කර ඇති බවත්,මෙමගින් අඹේවෙල ජලාශය මගින් උකහා ගන්නා ලද ජලය අඹේවෙල නුවරඑළිය මාර්ගයේ නුවරඑළිය යොවුන් සේනාංකය අසල පිහිටි ඉඩමක් වෙත පොම්ප කර එහිදී පිරිසිදු කර එම ජලය නැවත නල මාර්ග ඔස්සේ නුවරඑළිය නගර සභාවට අයත් සේවා ජාලාශය හැඩන් හිල් වෙත පොම්ප කිරීමට යෝජිතය.

ඒ අනුව නුවරඑළිය හා වැලිමඩ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශය තුළ ව්‍යාපෘතියේ සංචාරක ඉදිකිරීම සිදුකිරීමට සැලසුම් කර ඇත.මෙම ව්‍යාපෘතිය සඳහා නුවරඑළිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදී ඇති බැවින් ඒ සඳහා වැලිමඩ ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා**

වසර 60 කට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියන අඹේවෙල වාරි ව්‍යාපාරය ගොවිතැන් කටයුතු සඳහා ජලය සපයන ව්‍යාපාරයක් වන අතර මෙම වාරි ව්‍යාපාරය රජයේ පිළිගත් ගොවි සංවිධාන 05ක් යටතේ ක්‍රියාත්මක වේ.එසේම ඉන් එක් ගොවි සංවිධානයක ලේකම් ලෙස මා කටයුතු කරනවා.මෙම ගොවි සංවිධාන 05ම එකතු වි ඒකාබද්ධ ගොවි සංවිධානයක් පිහිටුවා ගෙන තියෙනවා.එහි සභාපතිවරයා ලෙසත් මා කටයුතු කරනවා.මෙම වාරි ව්‍යාපාරයට විශාල ලෙස ජල ඉල්ලීම් එන අතර විශේෂයෙන් උඩුබාදන,මාදෝවිට,බිබිලිගමුව,කළුබුළුලන්ද යන ප්‍රදේශයන් සඳහා ගොවිතැන් කටයුතු වලට අවශ්‍ය ජලය ලබා දෙන ඉල්ලීම් කරනවා.මෙවැති තත්වයක් තුළ වගාවට තිබෙන ජලය නුවරඑළියට ලබාදිම සිදු කල නොහැක.

එසේම වැලිමඩ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන කන්දේ ඇළ,පිටපොල, මහා එළිය හා අඹේවල වාරි ව්‍යාපාරය වශයෙන් ප්‍රධාන වාරි ව්‍යාපාර 03ක් ක්‍රියාත්මක වේ.මින් කන්දේ ඇළ හා පිටපොල, මහා එළිය වාරි ව්‍යාපාර මගින් ගොවිතැනට ඇති ජලය පානීය ජලය ලෙස ලබා දීම හේතුවෙන් එම ව්‍යාපාර අද වන විට කෘෂිකාර්මික වශයෙන් විශාල ගැටළු රැසකට මුහුණ දී සිටියි.අඹේවෙල ව්‍යාපාරයෙන්ද ජලය ලබා දීමට සිදුවුවහොත් අපට සිදුවන්නෙත් ගොවිතැන් කිරීමට ඇති ජලය නොමැති වී යාමයි.එසේම අපේ ගොවි සංවිධාන වලින්ද අඹේවල ව්‍යාපාරයෙන් නුවරඑළිය මහා නගර සභාවට ජලය ලබා දෙන ලෙස විටින් විට ඉල්ලම් කලද,ගොවි සංවිධාන විසින් එයට දැඩි ලෙස විරුද්ධ විය.මේ නිසා ගොවි සංවිධාන නියෝජනය කරන නියෝජිතයෙක් ලෙසත්,සභාව නියෝජනය කරන සභිකයෙක් ලෙසත්, මෙම ජල ඉල්ලීමට විරුද්ධවන බව මා ප්‍රකාශ කරනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා**

බෝගහකුඹුර නගරයේ රෝහලට,පාසලට, නගර වැසියන්ට බීමටවත් ජලය නොමැති අවස්ථාවක නුවරඑළිය මහ නගර සභාවේ ජලසම්පාදන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා අඹේවල වාරි ව්‍යාපෘතියෙන් ජලය ලබා දීම සම්බන්ධයෙන් ඉල්ලීමට මාගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා**

මෙම ඉල්ලීම දේශපාලන වෙනස් වීම් මත කාලයෙන් කාලයට පැන නගින ප්‍රශ්නයක්ය. එබැවින් මේ සඳහා මාද විරුද්ධ වන බව ප්‍රකාශ කර සිටිනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා**

හුලංකපොල්ල ප්‍රදේශයටවත් පානීය ජල ව්‍යාපෘතියක් නැති විටක නුවරඑළියට පානීය ජලය ලබා දීම ට සුදුසු නෑ කියලා මගේ අදහසයි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**

විවිධ දේශපාලන බලපෑම් මත වැලිමඩ ඉඩම් නුවරඑළියට පවරලා දීලා තියෙනවා .ඒවගේම අපට තියෙන ජලයද ලබා දුන්නොත් සිදු වන්නේ ජල සම්පතත් නැතිව යාමයි. එම නිසා සාකච්ජාවකටවත් නොයා විරුද්ධ විය යුතු කාරණාවක් ලෙස මා ප්‍රකාශ කරනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා**

මුලින්ම මේ ව්‍යාපෘතිය පිළිබඳව අදහස් දැක්වූ මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය පුද කර සිටින අතර අපේ තියෙන එක් ජල සම්පතක් වන උමා ඔය ද ලබා දී අවසන් වෙලා තියෙනවා.ඒ නිසා අපේ තියෙන ජල සම්පත වෙන දිස්ත්‍රික්කයකට දෙනවට වඩා අපේ දේ අපි රැක ගැනීම අපේ යුතුකමත් බව මා ප්‍රකාශ කරන අතර අඹේවල වාරි ව්‍යාපෘතියෙන් පානීය ජලය ලබාදීමට තදින්ම විරුද්ධ වෙන බව මා ප්‍රකාශ කරනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒම් කරුණාදාස මැතිතුමා**

බිබිලිගමුව, අලවතුගොඩ,ගොවි ජනතාව හා මැතිවරණ කොට්ඨාශයේ අමුණු 18 ක් නියෝජනය කරන ගොවි ජනතාව වෙනුවෙන් මා විරෝධතාව ප්‍රකාශ කර සිටිනවා.

➢ **ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

ඒ අනුව නුවරඑළිය ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට බහුතරදෙනාගේ එකඟතාවය නොමැති නිසා අවසාන වශයෙන් අපි වැලිමඩ ප්‍රාදේශිය සභාව විදිහට මැදිහත් වෙලා ඉදිරි කටයුතු සිදු කිරීමට හා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට යෝජනා කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. කරුණාරත්න මැතිතුමා** විසින් එළඹෙන ආසන්නම ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට යෝජනා කරන ලද අතර **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මේ අනුව මේ සම්බන්ධයෙන් බහුතර මන්ත්‍රීවරු සාකච්ඡා කල අතර නුවරඑළිය ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට එකඟතාවය පල කල නොහැකි බවට සභාවේ ඒකමතිකව තීරණය කල අතර එම විරෝධතාවය ඉදිරි ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට දැන්වීමට සුදුසු බව 2025.06.26 දින පැවති ගරු මහා සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදි.

➢ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. කරුණාරත්න මැතිතුමා**

ගොවියන්ගේ දැනුවත්වීම සහ ඉදිරි කටයුතු සඳහා එම ලිපියේ පිටපතක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**4.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා විසින් ගෙන එන ලද ප්‍රශ්නාවලිය**

1. වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති නිරවුල් හා නිරවුල් නොවූ සුසාන භූමි සංඛ්‍යාව කොපමණද?
2. වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති ග්‍රාම සේවා වසම් වලට අයත් සුසාන භූමි සංඛ්‍යාව හා එයින් එකිනෙකට හිමි භූමි ප්‍රමාණය කොපමණද?
3. වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සුසාන භූමි වෙත යෑම සඳහා අවම වශයෙන් කොන්ක්‍රීට් හෝ පඩිපෙල් පෙළක්වක් නොමැති සුසාන භූමි සංඛ්‍යාව කොපමණද?
4. වැලිමඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සුසාන භූමි මැනුම් කටයුතු අවසන් කර ඇති සුසාන භූමි සංඛ්‍යාව කොපමණද?

ඒඅනුව ගරු සභාපතිතුමා ඒ සඳහා ලිඛිත පිළිතුරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු ,**

➢ පැවරුම් නියෝග ඇති සුසානභූමි සංඛ්‍යාව 30
➢ මැනුම් කටයුතු අවසන් කර ඇති සුසානභූමි සංඛ්‍යාව 31
➢ මැනුම් කටයුතු සඳහා ඉල්ලුම් කර ඇති සුසානභූමි සංඛ්‍යාව 143

ප්‍රශ්න අංක **02** සඳහා පිළිතුරු

**වැලිමඩ ප්‍රාදේශීය සභාව - සුසාන භූමි ලේඛනය 2025**

| අනු අංකය | සුසාන භූමියේ නාම | ග්‍රාම සේවා වසම | ග්‍රාම සේවා වසමට අයත් සුසාන භූමි සංඛ්‍යාව | අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|---|---|---|---|
| 1 | නිදන්හැරුගොඩ සුසාන භූමිය | 48 අඹගහකුඹුර | 2 | 0 | 1 | 22 |
| 2 | කොකනාරෙවත්ත සුසාන භූමිය | 48 අඹගහකුඹුර | | 0 | 3 | 17 |
| 3 | පීල්ල අගල සුසාන භූමිය | 48 A දිවුරුම්ගම | 2 | හෙක්. 0.3177 | | |
| 4 | දිවුරුම්ගම සුසාන භූමිය | 48 A දිවුරුම්ගම | | 1 | 0 | 0 |
| 5 | දොඩම්ගොල්ලේ පතන සුසාන භූමිය | 48 B ගිරාඹේ | 5 | 0 | 2 | 1 |
| 6 | දෙහිපොල සුසාන භූමිය | 48 B ගිරාඹේ | | 0 | 1 | 2 |
| 7 | දෙහිපොල සුසාන භූමිය | 48 B ගිරාඹේ | | 0 | 2 | 5 |
| 8 | ගිරාඹේ සුසාන භූමිය | 48 B ගිරාඹේ | | 0 | 3 | 10 |
| 9 | සිරිපුර සුසාන භූමිය | 48 B ගිරාඹේ | | 1 | 0 | 0 |
| 10 | නුගතලාව තැන්න සුසාන භූමිය | 48 C වැලිමඩවත්ත | 4 | 0 | 2 | 8 |
| 11 | නුගතලාවේ තැන්න සුසාන භූමිය | 48 C වැලිමඩවත්ත | | 0 | 2 | 14 |
| 12 | වැලිමඩ වතුයාය සුසාන භූමිය | 48 C වැලිමඩවත්ත | | 0 | 0 | 15 |
| 13 | වැලිමඩ වතුයාය සුසාන භූමිය | 48 C වැලිමඩවත්ත | | 0 | 1 | 4 |
| 14 | මැදහින්නේ පතන සුසාන භූමිය | 49 විදුරුපොල | 8 | 0 | 2 | 0 |
| 15 | බැලුංගල මහවකදෝව සොහොන්බිම | 49 විදුරුපොල | | 0 | 3 | 30 |
| 16 | රජකදුරුවෙල වැටඹය සුසාන භූමිය | 49 විදුරුපොල | | 0 | 3 | 26 |
| 17 | දිවිගල් පිටිය සුසාන භූමිය | 49 විදුරුපොල | | 0 | 2 | 6 |
| 18 | මුදුන්පිටගම ඇත්ඔළුව සුසාන භූමිය | 49 විදුරුපොල | | 0 | 2 | 10 |
| 19 | රජකදුරුවෙල  සුසාන භූමිය | 49 විදුරුපොල | | 0 | 1 | 1 |
| 20 | විදුරුපොල සුසාන භූමිය | 49 විදුරුපොල | | 0 | 1 | 23 |
| 21 | පිඩිගහමැඩිල්ලේ පතන සුසාන භූමිය | 49 විදුරුපොල | | 0 | 2 | 0 |
| 22 | විලප්ටන්  සුසාන භූමිය | 49 A බොරගස් | 1 | 1 | 0 | 0 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23 | විමලහුලහ සුසාන භූමිය | 49 B සිල්මියාපුර | 2 | 2 | 0 | 0 |
| 24 | මැදවෙල පතන සුසාන භූමිය | 49 B සිල්මියාපුර | | 2 | 0 | 20 |
| 25 | හග්ගල වත්ත සුසාන භූමිය | 49 C හුලංකපොල්ල | 5 | 0 | 2 | 0 |
| 26 | හග්ගල වත්ත සුසාන භූමිය | 49 C හුලංකපොල්ල | | 0 | 2 | 0 |
| 27 | රේන්ද පොල හග්ගල සුසාන භූමිය | 49 C හුලංකපොල්ල | | 0 | 0 | 40 |
| 28 | හග්ගල සුසාන භූමිය | 49 C හුලංකපොල්ල | | 1 | 0 | 0 |
| 29 | හග්ගල (මුස්ලිම් සුසාන භූමිය) | 49 C හුලංකපොල්ල | | 1 | 0 | 0 |
| 30 | නිවිති අරාවේ දෝව සුසාන භූමිය | 49 E ගවරම්මාන | 3 | 0 | 0 | 31 |
| 31 | ගල්ඉද්දගොඩ සුසාන භූමිය | 49 E ගවරම්මාන | | 1 | 0 | 16 |
| 32 | කොකටියරොදේ හේන සුසාන භූමිය | 49 E ගවරම්මාන | | 0 | 2 | 0 |
| 33 | ගල්ගොඩ පතන සුසාන භූමිය | 50 පාලුගම නගරය | 6 | 0 | 2 | 0 |
| 34 | ගල්ගොඩ පතන සුසාන භූමිය | 50 පාලුගම නගරය | | 0 | 2 | 0 |
| | | 50 පාලුගම නගරය | | 0 | 2 | 29 |
| 35 | විල්සන්තැන්න සුසාන භූමිය | 50 පාලුගම නගරය | | 0 | 0 | 39 |
| 36 | කොස්ගහකුඹුරේ හින්න සුසාන භූමිය | 50 පාලුගම නගරය | | 1 | 0 | 25 |
| 37 | කොස්ගහකුඹුරේ හින්න සුසාන භූමිය | 50 පාලුගම නගරය | | 0 | 1 | 30 |
| 38 | කොස්ගහකුඹුරේ හින්න සුසාන භූමිය | 50 පාලුගම නගරය | | 0 | 2 | 3 |
| 39 | අරාව (අඹගහකඳුර) සුසාන භූමිය | 50 A අඹේවෙල | 3 | 0 | 1 | 38 |
| 40 | වැලිබිස්සේවෙල (ගැරඩියගොල්ල) සුසාන භූමිය | 50 A අඹේවෙල | | 0 | 2 | 2 |
| 41 | තවාන කිරිවැල්බැද්ද සුසාන භූමිය | 50 A අඹේවෙල | | 0 | 1 | 0 |
| 42 | වටගොඩපතන සුසාන භූමිය | 50 B තෙන්නකෝන්වෙල | 5 | 1 | 0 | 32 |
| 43 | කුඩාවේ පතන සුසාන භූමිය | 50 B තෙන්නකෝන්වෙල | | 1 | 1 | 11 |
| 44 | බෝගහමුල හේන සුසාන භූමිය | 50 B තෙන්නකෝන්වෙල | | 0 | 1 | 15 |
| 45 | පුරංවෙලදෝව සුසාන භූමිය | 50 B තෙන්නකෝන්වෙල | | 0 | 2 | 9 |
| 46 | පල්ලියද්දගොඩ සුසාන භූමිය | 50 B තෙන්නකෝන්වෙල | | 0 | 3 | 17 |
| 47 | දියකිවුලේ හේන සුසාන භූමිය | 50 C පාලුගම ඇල්ල | 4 | 0 | 1 | 0 |
| 48 | සරේ වත්ත සුසාන භූමිය | 50 C පාලුගම ඇල්ල | | 0 | 1 | 0 |
| 49 | ඌරම්මලතැන්න සුසාන භූමිය | 50 C පාලුගම ඇල්ල | | 0 | 1 | 33 |
| 50 | විහාරගාව හේන සුසාන භූමිය | 50 C පාලුගම ඇල්ල | | 0 | 0 | 37 |
| 51 | අම්පිටිගොඩ සුසාන භූමිය | 50 D කැප්පෙටිපොල | 1 | 0 | 2 | 20 |
| 52 | මල්නෙළුම්ගොඩ සුසාන භූමිය | 50 E එරබද්ද | 2 | 0 | 0 | 80 |
| 53 | පෙල්ලිවින්න සුසාන භූමිය | 50 E එරබද්ද | | 0 | 0 | 80 |
| 54 | පිටහකන්ද සුසාන භූමිය | 50 F හෙවනකුඹුර | 7 | 0 | 2 | 1 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 55 | උගුරුස්ස කුඹුරේ හින්න පතන සුසාන භූමිය | 50 F හෙවනකුඹුර | | 0 | 2 | 7 |
| 56 | ගලහිටි කපොල්ල සුසාන භූමිය | 50 F හෙවනකුඹුර | | 0 | 2 | 2 |
| 57 | අංකණුහින්න  සුසාන භූමිය | 50 F හෙවනකුඹුර | | 0 | 3 | 0 |
| 58 | මාරගහඇල්ල සුසාන භූමිය | 50 F හෙවනකුඹුර | | 1 | 1 | 20 |
| 59 | තිඹිරියගහකඳුරේ පතන සුසාන භූමිය | 50 F හෙවනකුඹුර | | 0 | 2 | 23 |
| 60 | පුරනේ කපොල්ල සුසාන භූමිය | 50 F හෙවනකුඹුර | | 0 | 2 | 36 |
| 61 | කොකාමලහේන සුසාන භූමිය | 50 G හිඹිලියගොල්ල | 2 | 0 | 0 | 63.76 |
| 62 | කුඩාවහේන සුසාන භූමිය | 50 G හිඹිලියගොල්ල | | 0 | 1 | 6 |
| 63 | සරේ වත්ත සුසාන භූමිය | 50 H දිමුතුගම | 1 | 0 | 2 | 0 |
| 64 | ටිකිහාතැන්න පතන සුසාන භූමිය | 50 I පුරංවෙල | 5 | 0 | 2 | 0 |
| 65 | විල්සන්තැන්න සුසාන භූමිය | 50 I පුරංවෙල | | 0 | 0 | 3 |
| 66 | අඹගහ අරාව නොහොත් හෙලේතැන්නේ පතන සුසාන භූමිය | 50 I පුරංවෙල | | 0 | 1 | 6 |
| | | | | 0 | 0 | 30 |
| 67 | කළුගල සුසාන භූමිය | 50 I පුරංවෙල | | 0 | 0 | 30 |
| 68 | කරගස්වගුර සුසාන භූමිය | 50 I පුරංවෙල | | 0 | 2 | 0 |
| 69 | මහවලතැන්න සුසාන භූමිය | 50 J බිබිලිගමුව | 3 | 0 | 2 | 0 |
| 70 | තැන්නේකරගහගාව සුසාන භූමිය | 50 J බිබිලිගමුව | | 1 | 0 | 0 |
| 71 | වැලිහෙලපතන සුසාන භූමිය | 50 J බිබිලිගමුව | | 1 | 0 | 0 |
| 72 | මහඇලේ පතන සුසාන භූමිය | 51 බෝගහකුඹුර | 4 | 0 | 3 | 4 |
| 73 | බටවැල්ගොල්ල සුසාන භූමිය | 51 බෝගහකුඹුර | | 1 | 0 | 31 |
| 74 | මැදගොඩ පතන සුසාන භූමිය | 51 බෝගහකුඹුර | | 0 | 1 | 5 |
| 75 | ගෝනගල පතන සුසාන භූමිය | 51 බෝගහකුඹුර | | 0 | 0 | 20 |
| 76 | බටපැලේ පතන නොහොත් බෝගස්හින්න සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | 8 | 1 | 1 | 32 |
| 77 | බංගලා තැන්න  සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | | 1 | 0 | 31 |
| 78 | හැද්දඹගස්තැන්න සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | | 1 | 0 | 18 |
| 79 | මැදුල් අරාව සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | | හෙක්. 0521 | | |
| 80 | දික්රොද සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | | 1 | 0 | 39 |
| 81 | අමරකෝන්ගම ගල්කන්දේ පතන සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | | 0 | 1 | 3 |
| | අමරකෝන්ගම ගල්කන්දේ පතන සුසාන භූමිය | | | 0 | 2 | 35.5 |
| | අමරකෝන්ගම ගල්කන්දේ පතන සුසාන භූමිය | | | 0 | 1 | 3 |
| 82 | නිකඅත්තගොඩ සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | | 0 | 3 | 10 |
| 83 | හීරියගල පතන සුසාන භූමිය | 51 A කළුබුළුලන්ද | | 0 | 1 | 38 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 84 | තෙලබේරියගොඩ සුසාන භූමිය | 51 B ඉඩමේගම | 6 | 0 | 3 | 18 |
| 85 | කොස්ලන්ද ඇල්ල සුසාන භූමිය | 51 B ඉඩමේගම | | 0 | 1 | 20 |
| 86 | වැලිහෙලපතන නොහොත් වැලිබිස්ස සුසාන භූමිය | 51 B ඉඩමේගම | | 0 | 3 | 7 |
| 87 | අලුත්තැන්න සුසාන භූමිය | 51 B ඉඩමේගම | | 0 | 1 | 1 |
| 88 | වියලකුඹුර සුසාන භූමිය | 51 B ඉඩමේගම | | 0 | 2 | 0 |
| 89 | තිබ්බටුවත්ත සුසාන භූමිය | 51 B ඉඩමේගම | | 0 | 1 | 0 |
| 90 | මඩවලතැන්න/ගල්කොටුව/උඩවෙල මිනීපිට්ටනිය | 51 C කන්දේපුහුල්පොල | 4 | 0 | 1 | 9 |
| 91 | වැරැල්ලෙ කැටිය සුසාන භූමිය | 51 C කන්දේපුහුල්පොල | | 1 | 3 | 37 |
| 92 | මහහෙළේ සුසාන භූමිය | 51 C කන්දේපුහුල්පොල | | 0 | 3 | 4 |
| 93 | බටුවැල්ගොල්ලේ හේන සුසාන භූමිය | 51 C කන්දේපුහුල්පොල | | 1 | 0 | 31 |
| 94 | වටගොඩ සුසාන භූමිය | 51 D අලවතුගොඩ | 5 | 1 | 1 | 17 |
| 95 | පෙල්ලගහ අරාව සුසාන භූමිය | 51 D අලවතුගොඩ | | 1 | 0 | 0 |
| 96 | වටගොඩ සුසාන භූමිය | 51 D අලවතුගොඩ | | 0 | 1 | 0 |
| 97 | ගැටලාගමු තැන්න සුසාන භූමිය | 51 D අලවතුගොඩ | | 0 | 1 | 4 |
| 98 | කුඩගොඩ කන්ද සුසාන භූමිය | 51 D අලවතුගොඩ | | 0 | 2 | 1 |
| 99 | ගන්නක් කුඹුර/ගල්ගොඩ පතන සුසාන භූමිය | 52 නැදුන්ගමුව | 5 | 0 | 2 | 26 |
| 100 | යෝධගොඩ සුසාන භූමිය | 52 නැදුන්ගමුව | | 1 | 0 | 13 |
| 101 | හෙලවෙල සුසාන භූමිය | 52 නැදුන්ගමුව | | 0 | 3 | 0 |
| 102 | කරගහවෙල සුසාන භූමිය | 52 නැදුන්ගමුව | | 0 | 3 | 27 |
| 103 | කරගහවෙල සුසාන භූමිය | 52 නැදුන්ගමුව | | 0 | 1 | 0 |
| 104 | දිවිතොටවෙල (හීන් ඇල්ල) සුසාන භූමිය | 52 A වැලිමඩ නගරය | 2 | 2 | 3 | 3 |
| 105 | අමුණේවෙල හින්න නොහොත් උඩමංකඩ සොහොන් බිම | 52 A වැලිමඩ නගරය | | 0 | 2 | 13 |
| 106 | ලන්දේගම සුසාන භූමිය | 52 B ලන්දේගම | 1 | 0 | 2 | 0 |
| 107 | මාවිතිකුඹුර සුසාන භූමිය | 52 C මාවිතිකුඹුර | 2 | 1 | 0 | 3 |
| 108 | ලුණුපොත්තාවෙල සුසාන භූමිය | 52 C මාවිතිකුඹුර | | 0 | 1 | 20 |
| 109 | කබිල්ලේගම සුසාන භූමිය | 52 D කබිල්ලේගම | 2 | හෙක්. 0.226 | | |
| 110 | ඇල්ල දාඹුගොල්ල සුසාන භූමිය | 52 D කබිල්ලේගම | | 0 | 2 | 26 |
| 111 | අම්පිටිගොඩ පතන සුසාන භූමිය | 58 දික්කාපිටිය | 2 | 0 | 2 | 1 |
| 112 | ගල්හින්නේ පතන සුසාන භූමිය | 58 දික්කාපිටිය | | 0 | 1 | 35 |
| 113 | අතුවැල්පොල පතන සුසාන භූමිය | 58 A කැටකැල්ල | 4 | 0 | 1 | 10 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 114 | යහලඅරාව සුසාන භූමිය | 58 A කැටකැල්ල | | 0 | 1 | 9 |
| 115 | මැදහින්න සුසාන භූමිය | 58 A කැටකැල්ල | | 0 | 2 | 11 |
| 116 | අම්බලන්තැන්න හෙවත් මැදහින්න සුසාන භූමිය | 58 A කැටකැල්ල | | 0 | 1 | 30 |
| 117 | ගල්බිස්ස සුසාන භූමිය | 58 B පුහුල්පොල | 2 | හෙක්. 0.196 | | |
| 118 | පුහුල්පොල සුසාන භූමිය | 58 B පුහුල්පොල | | 0 | 1 | 36 |
| 119 | හින්නාරංවතුගොඩ සුසාන භූමිය | 58 C කොස්කණුවේගම | 5 | 0 | 1 | 16 |
| 120 | වේල්ලෙ ඇල්ල සුසාන භූමිය | 58 C කොස්කණුවේගම | | හෙක් 0.102 | | |
| 121 | දියපීල්ල ඇල්ල සුසාන භූමිය | 58 C කොස්කණුවේගම | | 0 | 1 | 0 |
| 122 | අලකොල අරාව සුසාන භූමිය | 58 C කොස්කණුවේගම | | 0 | 1 | 34 |
| 123 | කැටකැල්ල සුසාන භූමිය | 58 C කොස්කණුවේගම | | 0 | 1 | 0 |
| 124 | කුඩුමිරිස්වැල් පතන සුසාන භූමිය | 59 නාවෙල | 4 | 1 | 0 | 38 |
| 125 | චන්දමඩුව සුසාන භූමිය | 59 නාවෙල | | හෙක්. 0.5018 | | |
| 126 | ගාල් පට්ටියෙතැන්න සුසාන භූමිය | 59 නාවෙල | | 0 | 2 | 2 |
| 127 | මහතැන්න (වැගොඩ) සුසාන භූමිය | 59 නාවෙල | | 0 | 2 | 0 |
| 128 | හද්දාවුල මුස්ලිම් සුසාන භූමිය | 59 A දඹවින්න | 2 | 0 | 3 | 13 |
| 129 | අක්කර 28 සුසාන භූමිය | 59 A දඹවින්න | | 0 | 3 | 16 |
| 130 | දිවිගල්තැන්න නොහොත් සූරියගස්තැන්න සුසාන භූමිය | 59 B යල්පත්වෙල | 3 | 0 | 0 | 35 |
| 131 | කටුනැටිගොඩ සුසාන භූමිය | 59 B යල්පත්වෙල | | 0 | 2 | 6 |
| 132 | ඇත්ඔළු කන්ද සුසාන භූමිය | 59 B යල්පත්වෙල | | හෙක්. 0.062 | | |
| 133 | අමුණුමුල්ල ගම සුසාන භූමිය | 59 C මැදගෙදරගම | 4 | 0 | 3 | 24 |
| 134 | මැදගෙදරගම රවන් ඉදලේ පතන සුසාන භූමිය | 59 C මැදගෙදරගම | | 0 | 2 | 0 |
| 135 | වැරැල්ල පතන (දඹගහ අරාව) සුසාන භූමිය | 59 C මැදගෙදරගම | | 1 | 1 | 32.7 |
| 136 | පේරඋල්පත සුසාන භූමිය | 59 C මැදගෙදරගම | | හෙක්.243 | | |
| 137 | මඩවලමුල්ලේ පතන (දිවිතොටවෙල කන්ද ආදානාගාරය) | 59 D දිවිතොටවෙල | 1 | 1 | 1 | 4 |
| | | | | 0 | 0 | 22 |
| 138 | කරගහ හින්නේ පතන සුසාන භූමිය | 59 E පහලයල්කුඹුර | 2 | 0 | 2 | 26 |
| 139 | උඩයල්කුඹුර පතන සුසාන භූමිය | 59 E පහලයල්කුඹුර | | 0 | 2 | 4 |
| 140 | රත්මැටිය සුසාන භූමිය | 60 මිරහවත්ත | 3 | | | |
| 141 | බලතොටඇල්ල සුසාන භූමිය | 60 මිරහවත්ත | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 142 | ගල්වත්ත සුසාන භූමිය | 60 මිරහවත්ත | | 0 | 3 | 9 |
| 143 | පිඩකුඹුර ගම සුසාන භූමිය | 60 A මල්පොත | 4 | 0 | 1 | 2 |
| 144 | මලින්තැන්න ගම වරු සොහොන්පල | 60 A මල්පොත | | 0 | 2 | 2 |
| 145 | මලින්තැන්න ගම හාවුන් කන්ද සුසාන භූමිය | 60 A මල්පොත | | 0 | 2 | 10 |
| 146 | උඩ මලින්තැන්න වැව ගොඩපතන සුසාන භූමිය | 60 A මල්පොත | | 0 | 2 | 0 |
| 147 | කුරුඳුවැල්පතන කුරුදියවල බොක්කේ පතන නොහොත් හතේකණුව සොහොන) | 60 B උඩුපීල්ල | 2 | 0 | 3 | 9 |
| 148 | සුදු සොහොන්පල සුසාන භූමිය | 60 B උඩුපීල්ල | | 0 | 1 | 31 |
| 149 | උඩවෙල සුසාන භූමිය | 60 C කොටකිතුල | 2 | 1 | 0 | 15.5 |
| 150 | කඩවලතැන්න සුසාන භූමිය | 60 C කොටකිතුල | | 1 | 1 | 1 |
| 151 | වැලිකඩගම මුස්ලිම් සුසාන භූමිය | 60 D වැලිකඩගම | 3 | 0 | 2 | 2 |
| 152 | සොහොන්පලා කපොල්ල සුසාන භූමිය | 60 D වැලිකඩගම | | 0 | 1 | 0 |
| 153 | වැලිකඩගම සුසාන භූමිය | 60 D වැලිකඩගම | | 0 | 1 | 0 |
| 154 | ගලමුදුන සුසාන භූමිය | 60 E හිඟුරුගමුව | 7 | 0 | 1 | 0 |
| 155 | රණවිරු සුසාන භූමිය | 60 E හිඟුරුගමුව | | 0 | 1 | 0 |
| 156 | කිරින්ද සුසාන භූමිය | 60 E හිඟුරුගමුව | | 0 | 1 | 0 |
| 157 | අම්පිටිකන්ද සුසාන භූමිය | 60 E හිඟුරුගමුව | | 0 | 1 | 0 |
| 158 | ඇස්වැද්දුමේ පතන සුසාන භූමිය | 60 E හිඟුරුගමුව | | 1 | 0 | 4 |
| 159 | කිරවනාගොඩ සුසාන භූමිය | 60 E හිඟුරුගමුව | | 0 | 2 | 0 |
| 160 | ලන්දේවෙල සුසාන භූමිය | 60 E හිඟුරුගමුව | | | | |
| 161 | කැටගාලගොඩ මුස්ලිම් සුසාන භූමිය | 61 ගුරුතලාව | 2 | 2 | 0 | 22 |
| 162 | මහතැන්න පතන සුසාන භූමිය | 61 ගුරුතලාව | | 2 | 0 | 34 |
| 163 | කරගස්තැන්න සුසාන භූමිය | 61 A කරගස්තැන්න | 3 | 0 | 2 | 3 |
| 164 | කදුරුදෙක සුසාන භූමිය | 61 A කරගස්තැන්න | | 1 | 0 | 0 |
| 165 | හපුරද සුසාන භූමිය | 61 A කරගස්තැන්න | | 1 | 0 | 0 |
| 166 | අලුගොල්ල සුසාන භූමිය | 61 B අලුගොල්ල | 1 | 0 | 3 | 38 |
| 167 | මහතැන්න සුසාන භූමිය | 61 C මහතැන්න | 1 | 1 | 0 | 0 |
| 168 | වලුගන්හින්න පතන සුසාන භූමිය | 62 රත්කරව්ව | 6 | 2 | 0 | 13 |
| 169 | දික්උල්පතේ පතන නොහොත් අඹගහඋල්පතේ පතන | 62 රත්කරව්ව | | 0 | 1 | 39 |
| 170 | ඕබඩ අරාව පතන සුසාන භූමිය | 62 රත්කරව්ව | | 0 | 1 | 16 |
| 171 | යල්පත්කන්ද පතන සුසාන භූමිය | 62 රත්කරව්ව | | 0 | 3 | 19 |
| 172 | බොක්කේ ඇල්ල සුසාන භූමිය | 62 රත්කරව්ව | | 0 | 1 | 0 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 173 | ගල්හින්නේ පතන  සුසාන භූමිය | 62 රත්කරව්ව | | 0 | 2 | 2 |
| 174 | තවලංපොල පතන සුසාන භූමිය | 62 A ඔහිය | 1 | 2 | 0 | 0 |
| 175 | කරමැටිය සුසාන භූමිය | 62 B බොරලන්ද | 4 | 0 | 2 | 0 |
| 176 | නාරංවැල්දෝවේ පතන සුසාන භූමිය | 62 B බොරලන්ද | | 1 | 0 | 3 |
| 177 | වටගොඩවෙල පතන සුසාන භූමිය | 62 B බොරලන්ද | | 1 | 0 | 0 |
| 178 | ගල්කනුගොඩ පතන සුසාන භූමිය | 62 B බොරලන්ද | | 0 | 1 | 39 |
| 179 | දඹගොල්ල සුසාන භූමිය | 62 C ගල්ඒදණ්ඩ | 3 | 0 | 2 | 0 |
| 180 | වටගොඩ  සුසාන භූමිය | 62 C ගල්ඒදණ්ඩ | | 0 | 2 | 0 |
| 181 | හෝම්පොල කපල්ල සුසාන භූමිය | 62 C ගල්ඒදණ්ඩ | | 0 | 1 | 37 |
| 182 | වංගියකුඹුර සුසාන භූමිය | 62 D වංගියකුඹුර | 3 | 1 | 0 | 0 |
| 183 | දඹගොල්ල සුසාන භූමිය | 62 D වංගියකුඹුර | | 1/2 | 0 | 0 |
| 184 | ඕලුගම සුසාන භූමිය | 62 D වංගියකුඹුර | | 1/4 | 0 | 0 |
| 185 | ගන්නිලගොඩ පතන සුසාන භූමිය | 62 E හින්නාරංගොල්ල | 4 | 1 | 0 | 0.7 |
| 186 | ගලබොඩ පතන සුසාන භූමිය | 62 E හින්නාරංගොල්ල | | 0 | 2 | 0 |
| 187 | ගලහිටියාව සුසාන භූමිය | 62 E හින්නාරංගොල්ල | | 0 | 2 | 24 |
| 188 | ගොරඩියාතැන්නේ පතන සුසාන භූමිය | 62 E හින්නාරංගොල්ල | | 0 | 3 | 0 |
| 189 | එඩරුගොල්ලේ පතන සුසාන භූමිය | 62 F රහංගල | 2 | 0 | 1 | 36 |
| 190 | ගෝරන්දියාතැන්නේ පතන සුසාන භූමිය | 62 F රහංගල | | 0 | 2 | 2 |
| 191 | නිදන්ගොඩ ගම සුසාන භූමිය | 62 G මාලිගාතැන්න | 4 | 0 | 1 | 34 |
| 192 | මාලිගාතැන්න සුසාන භූමිය | 62 G මාලිගාතැන්න | | 1 | 1 | 25 |
| 193 | මාලිගාතැන්න සුසාන භූමිය | 62 G මාලිගාතැන්න | | 0 | 3 | 2 |
| 194 | මාලිගාතැන්න සුසාන භූමිය | 62 G මාලිගාතැන්න | | 0 | 1 | 16 |
| 195 | ගෝනගල සුසාන භූමිය | 62 H හෙලයල්කුඹුර | 3 | 0 | 2 | 6 |
| 196 | ගෝනගල සුසාන භූමිය | 62 H හෙලයල්කුඹුර | | 0 | 0 | 8 |
| 197 | හෙලදෝව සුසාන භූමිය | 62 H හෙලයල්කුඹුර | | 0 | 3 | 0 |
| 198 | පිටපොල සුසාන භූමිය | 62 I පිටපොල | 4 | 0 | 2 | 0 |
| 199 | එලමල්අරාව සුසාන භූමිය | 62 I පිටපොල | | 0 | 1 | 0 |
| 200 | තඹගල සුසාන භූමිය | 62 I පිටපොල | | 1 | 2 | 0 |
| 201 | උඩුබිලිතැන්න සුසාන භූමිය | 62 I පිටපොල | | 0 | 3 | 0 |
| 202 | උඩකැන්දගොල්ල වැලිහින්න සුසාන භූමිය | 62 J උඩකැන්දගොල්ල | 3 | 0 | 2 | 0 |
| 203 | අමුණුගොඩපතන සුසාන භූමිය | 62 J උඩකැන්දගොල්ල | | 0 | 1 | 9.7 |
| 204 | අඹගස්දෝව පතන සුසාන භූමිය | 62 J උඩකැන්දගොල්ල | | 1 | 0 | 0 |

➢ **ප්‍රශ්න අංක 03 සඳහා පිළිතුරු**

මෙම ප්‍රශ්නය සඳහා සුසානභූමි සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර අවසන් වූ විගස පිළිතුරු ලබා දීමට කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදි.

➢ **ප්‍රශ්න අංක 04 සඳහා පිළිතුරු**

මැනුම් කටයුතු අවසන් කර ඇති සුසාන භූමි සංඛ්‍යාව කොපමණද? 31

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 01**

1987.අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ හා මූල්‍ය පරිපාලන රීති ප්‍රකාරව වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කටයුතු පවත්වාගෙන යාම සඳහා වන වියදම් දැරීමේදී රු:5,000.00 සිට යම් සීමාවක් දක්වා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව වියදම් ක්‍රමවේදයක් සැකසීම සුදුසු බවට මම මේ ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ඩී.පී.ඤානපාල සේනාධීර මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

➢ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඤානපාල සේනාධීර මැතිතුමා**

ප්‍රාදේශිය සභා පනත ආරම්භ වුයේ 1987 වර්ෂයේ නිසා සභාවේ කාර්යයන් හා කටයුතු පවත්වාගෙන යාම සඳහා වන වියදම් දැරීමේ සිමාව රු:5,000.00 ක සිමාවේ තබා ගත යුතු වුවත්, දැනට පවතින මුදලේ වෙනස් විම මත සභාවේ කටයුතු කිරිමට එය ප්‍රමාණවත් නොවන බැවින්, සභාපතිතුමාට එක් ගෙවීම් වවුචරයක් සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව වියදම් දැරීමේ උපරිම මුදල රු.500,000.00 ක් විය යුතු බව මම යෝජනා කරනවා.

➢ **ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

මෙතෙක් රු.5000.00 සීමාවේ සිට කටයුතු කරගෙන යාමේ දි දෛනික කටයුතු වලදි විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වු අතර හදසි අළුත්වැඩියා කටයුත්තක් සිදු කිරිමට වුවහොත් ඒ සඳහා මුදල් පියවා ගැනිම සඳහා මුදල් කමිටුව හෝ සභාව පැවැත්වෙන දිනයක් එළඹෙන තුරු සිටීමට සිදුවනවා. මේ නිසා ප්‍රදේශයේ පුරවැසියන්ට හා සභාවේ වැඩ කටයුතු කර ගැනිමේ දි දුෂ්කරතාවයන්ට මුහුණදිමට සිදුවන අතර එම ගැටළු මගහරවා ගැනිමේ අරමුණින් මෙම යෝජනාව ගෙනා ආ අතර මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගේ තුමියන්ලාගේ පැත්තෙන් වඩාත් අවධානය යොමු කරමින් මීට අදාළ මැදිහත්වීම කරන ලෙස ඉල්ලා සිටිනවා.

➢ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. ඉන්දික සම්පත් මැතිතුමා**

සභාපතිතුමනි, ඤානපාල මන්ත්‍රීතුමා පැවසූ පරිදි පනතේ වියදම් සීමාව ලෙස පවතින රු5000.00ක මුදල වෙනස් විය යුතු බව මා පිළිගන්නවා. පසුගිය සභාවාරයේදී සිටි සභාපති වරයාද එම සීමාව වෙනස් කිරීමට යාමේදී ඔබතුමන්ලා එයට විරුද්ධ වුණා. නමුත් දැන් ඔබතුමන්ලා එය වෙනස් කළයුතු බව පවසනවා.ඇත්තටම එය

වෙනස්විය යුතු බැවින් ,පසුගිය සභාපතිවරයාටද එක්වරකට වියදම් දැරීමේ සීමාව රු.250,000.00 තිබු බැවින්,මේ සභාපතිවරයාටද රු.250,000.00 ක මුදලක් තිබිම සුදුසු බව මා යෝජනා කරනවා.තවද සභාවේ කටයුතු අඩාල කිරිමේ අරමුණක් අපට නොමැති අතර පසුගිය සභාපතිවරයා විසින් ඔහුගේ අනුමැතිය පරිදි වියදම් කරන මුදල් පිළිබදව සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කලත් එම වියදම් සභාවට ඉදිරිපත් කළ නොකල බැවින් නව සභාපතිවරයා විසින් ඔහුගේ අනුමැතිය පරිදි කරන වියදම් මුදල් කමිටුවට හෝ සභාවට ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

➢ **ගරු මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

සභාපතිතුමනි,පසුගිය සභාවාර වලදී ඔබතුමන්ලා රු:5000.00ට විරුද්ධ වූ අතර දැන් එම මුදල සිය ගුණයකින් වැඩිකර රු.500,000.00 ක මුදලක් යෝජනා කරලා තියෙනවා. ඔබතුමන්ලා සාධරණත්වය හා නීතිය පැත්තට අදාළව කටයුතු කිරීම සහා කටයුතු වලදී යහපත් දෙයක් බවත් මා ප්‍රකාශ කරන අතර සම්පත් මන්ත්‍රීතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

➢ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා**

සභාපතිතුමනි,ගරු ප්‍රභාත් රවීන්ද්‍ර මන්ත්‍රීතුමා සහ ගරු ඉන්දික සම්පත් මන්ත්‍රීතුමන්ලා යන අය රු:5000.00 සීමාව සියගුණයකින් වැඩි කර නොගන්නා ලෙස පවසා සිටියා. නමුත් මේ පනත 1987 සිට පැවත එන එකක් නිසා 2018 වර්ෂයේදී රු. 250,000.00 ක මුදල යෝජනා වී ඇති අතර කාලීන වශයෙන් මුදලේ අගය වෙනස් වී ඇති නිසා මෙම සීමාව වෙනස් විය යුතුය.

පසුගිය සභාවාරයේ දි රු5000.00 ක සිමාව තුළ කටයුතු කල යුතු බව යෝජනා වුනා. ඒ අනුව කටයුතු කිරිමේ දි සුළු සේවක වැටුප් ගෙවීම සහ අනෙකුත් වියදම් කටයුතු යනාදිය සිදු කිරීමට මුදල් වියදම් කිරීමට යාමේදී මුදල් කමිටුව පැවැත්වෙන දිනය වනතුරු සිටීමට සිදු වීමත්,මුදල් කමිටුවේදී ලේකම්තුමා විසින් ඩෝසරයක් කැඩී ඇති බවත් එය සෑදීමට ලක්ෂ 05ක් පමණ අවශ්‍ය බවත් පැවසූ බැවින් එය සෑදීමට සභාපතිතුමාට එම වියදම් කිරීමට මුදල් කමිටුව එනතුරු සිටීමට සිදුවීමත් ,යන ගැටළු රැසකට මුහුණදිමට දීමට සිදු වුණා.

මේ නිසා මා හිතන්නේ රු.500,000.00 ක මුදල සුදුසු බවයි. එසේම මෙම මුදල යොදාගනු ලබන්නේ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරිම නිසා මෙම මුදල කාලීන වශයෙන් සාධාරණ මුදලක් වන අතරම ලක්ෂ පහක මුදලක් අනිවාර්යෙන්ම තිබිය යුතු යැයි මමත් යෝජනා කර සිටිනවා.

➢ **ගරු මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

සභාපතිතුමනි, 2018 වර්ෂයේදී රු:5000.00 සීමාවේ පවත්වාගෙන යායුතු බවට ගරු මන්ත්‍රී ගුණවර්ධන මැතිතුමා යෝජනා කළ අතර ස්ථිර කරන ලද්දේ ගරු රාසලිංගම් මැතිතුමා ය.පසුගිය සභාවේ සිටි සභාපතිවරයා රු:5000.00 සීමාව වැඩි කරන්න පැවසූ විට ඔබතුමන්ලා ඒකට එදා විරුද්ධ වෙලා අද ඒ තීරණයට විරුද්ධ වීම සාධාරණ නෑ කියලා පිළිගැනීම පිළිබඳව මා සතුටු වෙනවා.

ඔබතුමන්ලා ආවේ මේ දේ නීත්‍යානුකූලව කර ගෙන යන්න නම් පනත අනුව කටයුතු කළයුතුයි. ඔබතුමන්ලා ඒ කාලයේ කටයුතු කළ ආකාරයට ඉදිරියට කටයුතු කරන ලෙසත්,පවසමින් සම්පත් මන්ත්‍රීතුමා

යෝජනා කළ   රු. 250,000.00 මුදල මම ස්ථිර කරනවා. ඔබතුමන්ලා බෙදීමකට ගොස් ලක්ෂ පහක මුදල තබා ගන්නා ලෙසත්,ඉදිරියට බහුතරය රැක ගන්නා ලෙසත්  මා පවසා සිටිනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී   එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමනි,වැලිමඩ ප්‍රාදේශීය සභාව විශාල  වපසරියකින් යුක්ත බැවින් ඇතිවන පරිපාලන හා ප්‍රායෝගික ගැටලු නිරාකරනය කර ගන්න මුදල් කමිටුව එනතුරු ඉන්න බැරි අවස්ථා තිබෙන බව මා  පිළිගන්නවා. නමුත් ටයර් එකක් දැමීම වැනි කටයුතු විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකට අනුව සිදු කළයුතුය.එසේ නොකරන්නේ නම්  විනිවිදභාවය නැතිවෙනවා. අනුමත මුදල් සීමාව තුල කරන සියලු කාරණා මහ සභාව දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටිනවා. තවද දැනට ලක්ෂ දෙක හමාරෙ මුදල තබාගෙන කටයුතු සිදු කර ඉන්ඔබ්බටත් ගැටලු පැන නගී නම් ඉදිරි සභාවලදී සාකච්ඡා  කර යම් යම් තීරණයක් ගනිමු කියා මා  ප්‍රකාශ කර සිටිනවා .

- **ගරු මන්ත්‍රී ජී. ධනුෂ්ක තිලකසිරි මන්ත්‍රීතුමා**

ගරු සභාපතිතුමනි, සභාපතිතුමාට වියදම් කිරීමේ සීමාව පිළිබඳව පසුගිය සභා වාරය තුළදීද විවිධ සාකච්ඡා මත ගොඩ නැගුණු අතර එම යෝජනාව මෙම  සභාවාරයට කල් දාගෙන මේ සම්බන්ධව තීරණයක් ගැනිමට යෝජනා වුණා. ඒ නිසා මේ සම්බන්ධව තීරණයකට එළඹීමේ අරමුණින්  තමයි ගරු ඥානපාල සේනාධීර මන්ත්‍රීතුමා විසින්  සභාපතිතුමාට එකවරකට වියදම් කරන්න පුළුවන් සීමාව  (රු.500,000.00) ලක්ෂ පහ දක්වා වැඩි කර ගන්නා ලෙස යෝජනා කලේ.මෙම මුදල යෝජනා කර ඇත්තේ සභාපතිවරයාට අභිමතය පරිදි වියදම් කිරීමට නොව  සභාවේ කටයුතු පහසුවෙන් පවත්වාගෙන යාම සඳහායි. මේ සම්බන්ධයෙන් විනිවිධභාවය නෑ කියන කාරණාව වත්,පසුගිය සභාවල තිබූ ලක්ෂ දෙකහමාරේ කාරණාව වත් ගෙනල්ලා ඒකට ලඝු කරන්න එපා කියා මා ඉල්ලා සිටිනවා.ජාතික ජනබල වේගය විදිහට අපි හැමෝටම ඕනෑම වෙලාවක සභාවේ හෝ මුදල් කමිටුවෙන් ප්‍රශ්න කිරීම සඳහා අවස්ථාවක් දී ඇති බව මා ප්‍රකාශ කර සිටිනවා.

එම නිසා  දැන් ඇවිල්ලා ඉන්නෙ අලුත් සභාපතිවරයෙක් නිසා  විනිවිදභාවයෙන් යුතුව සභාවේ කටයුතු බොහොම ගෞරවනීය විදිහට කරගෙන යාමට ලක්ෂ පහක මුදල මගේ පැත්තෙන් මම යෝජනා කරනවා.

- **ගරු මන්ත්‍රී ජේ.එම්. ඉන්දික සම්පත් මැතිතුමා**

සභාපතිතුමනි, දිගින් දිගටම ලක්ෂ පහක මුදලක් යෝජනා වන බැවින් මීට පෙර සභාවල කටයුතු සිදු කළේ නැද්ද කියලා මට සිතෙනවා. ගරු සභාපතිතුමනි, මේක දේශපාලන වේදිකාවක් කරගතයුතු නොමැති අතර ඔබතුමන්ලා ඇවිල්ලා ඉන්නෙ ගම හදන්න බවත් ,ඒකට සහය ලබා දෙන්න අපි සූදානම් බවත්,මා පවසනවා.ඒ නිසා ලක්ෂ දෙක හමාර යෝජනා කළ බවත්,ඊට වඩා වැඩිවන මුදලට අපි අකමැති බවත්,මා ප්‍රකාශ කර සිටිනවා.

- **ගරු මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පසුගිය සභාවේ සිටි සභාපතිවරයා රු:5000.00 සීමාව වැඩි කරන්න පැවසූ විට ඔබතුමන්ලා ඒකට එක හෙලාම විරුද්ධ වෙලා එදා ඒ තීරණයට විරුද්ධ වීම සාධාරණ නෑ කියලා අද පිළිගැනීම පිළිබඳව මා සතුටු වෙනවා.ඒ සමඟම අපි රු250,000.00 ක මුදල් සීමාවේ සිටින බවත්,ඔබතුමන්ලා ඡන්දයකට ගොස් බෙදීමක් ලබා ගෙන ලක්ෂ පහක මුදල් සීමාව ලබා ගන්නා ලෙසත් මා ප්‍රකාශ කර සිටිනවා.

- **ගරු මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී ලක්ෂ දහයක් යෝජනා කර තියෙනවා. චාමර මන්ත්‍රීතුමා හිරේ ගොස් ඇත්තේද ලක්ෂ දහයක ප්‍රශ්නයකටය. ඒ නිසා රු.5000.00 සීමාව ප්‍රමාණවත් නොවන බව පිළිගන්නවා .නමුත් ටයර් එකක් දැමීම වැනි කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව අඩුම මිලට සිදු කළයුතු බව ආයතන අධ්‍යක්ෂක වරයෙක් විදිහට මා ප්‍රකාශ කර සිටිනවා.ගරු ප්‍රභාත් මන්ත්‍රීතුමා,ගරු ඩිලාන් මන්ත්‍රීතුමා, ගරු සම්පත් මන්ත්‍රීමා යන අය යෝජනා කළ පරිදි පක්ෂයක් විදිහට ලක්ෂ දෙක හමාර මුදල වඩාත්ම කාලෝචිතයි යැයි මා සිතනවා.

- **ගරු මන්ත්‍රීනී ජේ.පී. චිත්‍රා පතිරණ මැතිනිය**

ගරු සභාපතිතුමනි, රටේ දේශපාලනය මෙතැනට අරගෙන කථා කිරීම අනවශ්‍ය කාලය ගත කිරීමක් සිදු වන අතර ජාතික මට්ටමේ ප්‍රශ්නවලට පිළිතුරු මාධ්‍යයෙන් දැන ගැනීමට ලැබෙනවා. අපේ මෙතන ප්‍රධානම අරමුණ විය යුත්තේ වැලිමඩ ප්‍රාදේශීය සභාවෙ ඉදිරි අනාගතය පිළිබඳව සාකච්ඡා කිරීමයි. අපි සියලු දෙනාම නීතියට යටත් බවය.එසේම සියලුම මුදල් වලට අන්තිම ශතය දක්වා වගකිව යුතුයි.වෙන් වන මුදල කොපමණ වුණත් ඒ මුදලට වග කියන්න, වගකීම අරගෙන කටයුතු කිරිමට බැඳී සිටිනවා.එම නිසා මමත් අපි සියලු දෙනාමත් යෝජනා කරපු ලක්ෂ පහේ මුදලට එකඟතාවය පල කරන බව මා කියා සිටිනවා.

- **ගරු මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය**

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රභාත් රවීන්ද්‍ර මන්ත්‍රීතුමා සහ ගරු ඉන්දික සම්පත් යන මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වූවා මීට පෙර හිටපු සභාපතිවරයාට රු:5000 සීමාව වැඩි කර ගැනීමට ඉඩ නොදුන් බව එයට හේතුව වන්නේ එතුමාගේ මූල්‍ය පරිපාලනය පිළිබඳව විනිවිධ භාවයක් නොමැති වීමයි.අපි විපක්ෂයේ සිටින විටත් බැඳිලා හිටියේ මේ රටේ මිනිසුන්ගේ මුදල් පරිස්සම් කරන්න. දැන් අපිට මිනිස්සු බලය දීලා තියෙන්නෙ මෙතැනට ඇවිල්ලා වැඩ කරන්න.ඒ වැඩ කරන කාරණයේදී අපි විනිවිධභාවයෙන් කටයුතු කරනවා කියලා මිනිසුන්ටත්,සභාවටත් විශ්වාසය දීලා තියෙනවා. ඒ නිසා ලක්ෂ 05ක මුදල තබා ගැනීම තුලින් විනිවිධභාවයට හානියක් සිදු වෙන්නේ නෑ.ඒසේ විරුද්ධ වෙනවා නම් බෙදීමකට ගොස් ප්‍රශ්නය අවසන් කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

- **ගරු මන්ත්‍රී එම්.ජබාර් තුවාන් කාසිම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, රු:5000.00 සිමාව ලක්ෂ පහ දක්වා වැඩි කළ විට අලුතෙන් පත්වෙන ආණ්ඩුව නැවත එම මුදල වැඩි කරන අතර එසේම ඉන්දික සම්පත්,ප්‍රභාත් රවීන්ද්‍ර යන මන්ත්‍රීතුමන්ලාගෙන් කලින් සභාවල සභාපතිවරුන් වැලිමඩ ප්‍රාදේශීය සභාව පාලනය කිරීම පිළිබඳව දැනගන්නට ලැබුණා..එබැවින් එවැනි සභාපතිවරයෙක් බිහි වුවහොත් වෙන පැත්තකට සභාව යොමු වන බැවින් සීමාවක් යොදාගනිමින් ලක්ෂ දෙකහාමාරක් මුදල යොදා ගෙන කටයුතු සිදු කර බලමු යැයි මා පවසා සිටිනවා.

- **ගරු මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රභාත් රවීන්ද්‍ර මන්ත්‍රීතුමා සහ ගරු ඉන්දික සම්පත් යන මන්ත්‍රීවරු එතුමන්ලාගේ අත්දැකීම් මත රු:5000.00 සීමාව ලක්ෂ පහ දක්වා වැඩි කර නොගන්නා ලෙස පවසා ඇත. පසුගිය සභාවලදී සභාපතිතුමා අපිවත් නොදැන සමහර ව්‍යාපෘති කරලා තියෙනවා. මෙම මුදලට එකඟනොවන්නේ ඔබතුමන්ලා

ගැන අවිශ්වාසයකින් නොවන බවත්,ඉදිරියේදී ඔබලාගේ කටයුතු පිළිබඳව අවධානය යොමු කරන බවත්,පසුව අවශ්‍යතාවය අනුව සාකච්ඡා කර මුදල වැඩි කර ගන්නා ලෙසත්, පවසමින් ලක්ෂ 2,50,000 .00ක සීමාව තබා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

- **ගරු මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, දැනටමත් යෝජනා 02ක් සභාගත වී ඇති නිසාත් , කාලීන වශයෙන් වෙනස් විය යුතු තැන වෙනස් විය යුතු නිසාත් අපේ පැත්තෙන් අපි ලක්ෂ පහක මුදල යෝජනා කරනවා.වැලිමඩ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන ජාතික ජනබල වේගය ලෙස රටට වගකියන, ජනතාවට වගවන, දේශපාලන පක්ෂයක් විදිහට මන්ත්‍රීතුමන්ලා වන ඔබට පමණක් නොව ,වැලිමඩ සමස්ථ ජනතාවට, විනිවිධභාවය ඔප්පු කරන සභාවක් බවට අපි කටයුතු කිරීමට සූදානම්ය.ඒ නිසා ඔබතුමාගේ පැත්තෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මගේ පැත්තෙන් මා ඉල්ලා සිටිනවා.

- **ගරු මන්ත්‍රී ජේ.එම්. ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,කරුණාරත්න මන්ත්‍රීතුමා බෙදීමකට යාමේ අවශ්‍යතාවය ඉස්මතු කරන බව පෙනීයනවා. ජාතික ජනබලවේගය හැර අනිත් පක්ෂ සියලු දෙනාම රු:5000.00 සීමාව රු:250,000.00 ක් තබන ලෙසටමා ඉල්ලනවා.ඔබතුමන්ලාට බලය තිබෙන බැවින් බෙදීමකට ගොස් විරුද්ධ අයට විරුද්ධ වීමටත්, අවස්ථාව තිබෙන නිසා බෙදිමකට ගොස් කටයුතු කරනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සභාවේ මන්ත්‍රීවරු සභාව පවත්වාගෙන යාමට සහයෝගය ලබා දෙන බව මීටපෙර තියලා තියෙවා. ඒ නිසා විනිවිධභාවය තිබේ නම් මුදල නොව වැදගත් වන්නේ පුද්ගලයා බව මා සිතනවා. ඔබතුමන්ලා අපට සහයෝගය ලබා දෙනවා යන තැන සිටිනවා නම් අපේ ලක්ෂ පහක මුදලට සහයෝගය ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

- **ගරු මන්ත්‍රී ජේ.එම්. ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සභාව පවත්වාගෙන යාමට සහයෝගය ලබා දීමේ අරමුණින් තමයි. රු:5000.00 සීමාව රු.250,000.00 දක්වා වැඩි කලේ.මෙම ප්‍රශ්නය දිගින් දිගටම සාකච්ජා කළද එය අවසන් නොවන බැවින් ඔබතුමා බෙදීමකට ගොස් තීරණයක් ගන්න.

- **ගරු මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කෝසල මන්ත්‍රීතුමා පැවසූ පරිදි අපි ඔබතුමන්ලා ගන්නා සෑම තීරණයකටම සහයෝගය ලබා දෙන බව කිව්වේ නෑ.රු.5000.00 සීමාවේ සිට මාසයක කාලයක් තුළ කටයුතු සිදු කළ බවත්,දැනට රු:2,5000.00 මුදල යොදාගනිමින් කටයුතු කර ,ගරු දයාරත්න මන්ත්‍රීතුමා පැවසූ පරිදි මුදල වැඩි කර ගන්නා ලෙසත් මා ඉල්ලා සිටිනවා.

- **ගරු මන්ත්‍රී එම්.ජබාර් තුවාන් කාසීම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කෝසල මන්ත්‍රීතුමා අපි සහයෝගය ලබා නොදෙන බව පවසුවා.වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් රැකීමට සහයෝගය ලබා දීමට තමයි රු:250,000.00 මුදල යෝජනා කලේ.

- **ගරු මන්ත්‍රී ජේ.එම්. ඉන්දික සේනාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කෝසල මන්ත්‍රීතුමා කිවූ පරිදි අදට ගැලපෙන විදිහට වෙනස් කර ගැනීමට සම්පූර්ණයෙන් එකග වෙනවා. එදා සහ අද ඩොලරයේ වටිනාකම වෙනස් වෙලා තියෙනවා. බලය ගැන උදම්වෙලා කෑ ගහනවානම් බොරුවට කෑගහලා වැඩක් නෑ.බොරගස් එකේ ඡන්ද 2ක් ගියා නම් ඔබලා අද අද ඔබලා බලයේ නෑ.ඒ නිසා නම්‍යශීලි වෙලා රු:250,000.00 ක සීමාවේ සිට කටයුතු කරමු යැයි ද එසේ නොමැති නම් ඔබතුමා බෙදීමකට ගොස් තීරණයත් ගන්න.

- **ගරු මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය**

ගරු සභාපතිතුමනි, ගරු ඉන්දික සම්පත් මන්ත්‍රීතුමා අඛණ්ඩව වැලිමඩ ප්‍රාදේශීය සභාව නියෝජනය කල බව පැවසුවා.පෙර පූර්වාදර්ශ ගනිමින් ජාතික ජන බලවේගයේ සභාපතිවරයා හා මන්ත්‍රිවරයා පිලිබදව මිනුම් දණ්ඩකට නොඑන ලෙස මා ඉල්ලා සිටිනවා.මේ මුදල් සිමාව වැඩිකරගැනීමට හේතු වූයේ ප්‍රාදේශීය සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත පමණයි.එසේම ගරු සභාපතිතුමා රැකියාව අතහැර සේවය කරන කෙනෙක්. මේ සභාව නියෝජනය කරන අපේ මන්ත්‍රීවරුන් සියලුදෙනාම ද පෞද්ගලික දීමනාවක් සභාවෙන් ලබා ගන්නේ නෑ.ඒ රටට ගමට සේවය කිරිමට අවැසි බැවින්ය.

මෙම මුදල් සීමාව වැඩි කිරිමට යෝජනා කරන්නේ ලබන්නේ වැලිමඩ ජනාතාවට සේවය කිරිමට මිස පෞද්ගලික අරමුණු මුල් කරගෙන නොවෙයි.ඒබැවින් .රු.500,000 ක මුදලට සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජබාර් තුවාන් කාසීම් මැතිතුමා**

ලක්ෂ දෙකහමාර සහ ලක්ෂ 10 මුදල සභාව පාලනය කරන්න දාගෙන සිටින මුදලක්ද යන්න අනෙක් මන්ත්‍රීවරුන් පවසන බැවින් ඒ දේ පැහැදිලි කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

- **ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

මෙම ලක්ෂ පහක මුදල සභාපතිවරයාට හෝ මෙතන ඉන්න කිසිදු මන්ත්‍රීවරයෙකුට හෝ නිලධාරියකුට අභිමතය පරිදි වියදම් කර ගන්න බෑ.පසුගිය සභා වාර වලදී ජාතික ජනබලවේගය විදිහට මන්ත්‍රීවරු 03ක් සභාව නියෝජනය කලත් ඒ කාලේ ගෙනා යෝජනාවට විරුද්ධ වීමට හේතුව ගරු සම්පත්,ගරු ප්‍රභාත් යන මන්ත්‍රීවරුන්ගෙන්ම දැන ගන්නට ලැබුණා.(වියදම් කරේ මොනාටද කියලා අදටත් අපි දන්නෑ කියලා.) සභාවක් විදිහට වියදම් කරන හැම සතයකටම අපේ පණටත් වඩා වග කියනවා. මෙතනදී මතු වූ චාමර සම්පත් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නෙ පවා සිද්ධ වූයේ ආණ්ඩුවක් හා සභාවක් විදිහට වංචා දූෂණ පිටු දකින්න අදාළ මැදිහත්වීම් කරපු නිසයි.ඒ වගේම සභාවාර දෙක තුනක් යනවිට ගරු මන්ත්‍රීතුමන්ලාට, තුමියන්ලාට කලින් සභාවාර තුළ

කටයුතු කලේ කෙසේද යන්න පැහැදිලි කර ගැනිමට හැකි වෙයි. මේ වියදම් කරන හැමදෙයක් ගැනම මුදල් කමිටුවට හා මහා සභාවට ඉදිරිපත් කරනවා.

මෙම යෝජනාව සඳහා මන්ත්‍රීතුමන්ලාගේ පැත්තෙන් සැලකිය යුතු මන්ත්‍රීවරු ප්‍රමාණයක් අදහස් දක්වා තිබෙනවා.ඒ අනුව යෝජනා දෙකක් ඉදිරිපත් වී තිබෙන බැවින් ලක්ෂ පහක මුදලට හා ලක්ෂ දෙක හමාරක යන යෝජනා 02ට එකඟතාවට ලබා ගැනීමට කටයුතු කරමු.

➢ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා**

සියලුම මන්ත්‍රීවරු කථා කළ දේවල් වාර්තාවට ඇතුළත් කර වාර්තාවක් නිසි ආකාරව ලබා දෙන ලෙස, මා ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා.

➢ **ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

සියලුම මන්ත්‍රීවරුන් 29 (01) රීතිය අනුව කටයුතු කරන ලෙස ඉල්ලනවා. ඉහත යෝජනාව සම්බන්ධයෙන් එකඟතාව ලබා ගැනීමට ඡන්දයකට යාමට කටයුතු කරනවා.

ඒ අනුව මෙකී යෝජනාව සම්බන්ධයෙන් ලක්ෂ දෙක හමාර සහ ලක්ෂ 05 මුදල් යෝජනා වූ බැවින් ඒ සඳහා ඡන්ද විමසීමක් කරන ලදි. මේ අනුව 1987.අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ හා මූල්‍ය පරිපාලන රීති ප්‍රකාරව වැලිමඩ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කටයුතු පවත්වාගෙන යාම සඳහා වන වියදම් දැරීමේදී රු:5,000.00 සිට යම් සීමාවක් දක්වා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව වියදම් ක්‍රමවේදයක් සැකසීමේ යෝජනාවට සිදු කරන ලද ඡන්ද විමසීමේ දි රු.ලක්ෂ 05ක් දක්වා ගෙවීම් කිරීමේ බලයට පක්ෂව ඡන්ද 23ක්ද, විපක්ෂව ඡන්ද 11ක්ද, ඡන්ද දිමෙන් වැලකී සිටි මන්ත්‍රීවරු 01ක් ලෙසද, නොපැමිණි මන්ත්‍රීවරුන් 02ක් වශයෙන්ද ඡන්දය සටහන් විය.

ඒ අනුව ගරු සභාපතිතුමා එක් ගෙවීම් කිරීමක් සඳහා උපරිම ලක්ෂ 05ක් දක්වා බලය පැවරීමට වූ යෝජනාව වැඩිඡන්ද 12 ක බහුතර ඡන්දයෙන් 2025.05.26 දින සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මහතා පෙ:ව:10.55ට සභාවට පැමිණෙන ලදි.**

**යෝජනා අංක - 02**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 133 වගන්තිය ප්‍රතියෝජනා කරමින් නිර්දේශ කරන ලද 2012 අංක 21 දරණ පලාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ අංක 16 වගන්තිය ප්‍රකාරව වැලිමඩ ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කරනු ලබන සියළු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකරවලට පළමු අත්සන් කිරීමේ බලය වර්තමාන සභා ලේකම් ඩී.එම්.පී.එස් බණ්ඩාර මහතාටත් ,දෙවන අත්සන් යෙදීමේ බලය මුදල් සහකාර කේ.ඒ. විනීතා මියටත්, පැවරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එම්.හුසෙයින් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

- **ප්‍රාදේශීය සභා ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

ඒ අනුව මෙකී යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාවේ විරෝධතා හෝ අදහස් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට දන්වා සිටින ලදි.

මේ සම්බන්ධව විරෝධතා ,අදහස් හා යෝජනා නොමැති වූ හෙයින් එම යෝජනාව 2025.06.26 දින මහ සභාවේදී ඒකමතිකව සම්මත විය.

**යෝජනා අංක 03**

**ගරු මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා**

පළාත් පාලන පනතට අනුව 12/1 වගන්තිය ප්‍රකාරව ඉහත මෙම කාරක සභා කමිටු නියෝජනයට අමතරව පළාත් පාලන බල ප්‍රදේශය නියෝජනය කරන්නාවූ සභා බල ප්‍රදේශයේ බාහිර සිවිල් පුරවැසියන්ගේ නියෝජනයක් ලබා ගැනීමට ව්‍යවස්ථානුකූලව අපට අවස්ථාවක් ඇත. ඒ අනුව ඒ ඒ විෂය පිළිබඳ දැනුම අවබෝධය ඇති සිවිල් සමාජ නියෝජිත කණ්ඩායමක් ඉහත මෙම කාරක සභා කමිටු සඳහා තෝරා පත් කර ගැනීමට අප සභාව කටයුතු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කර සිටිනවා.

- **ගරු මන්ත්‍රී ජේ.ඒම්.ඉන්දික සම්පත් මැතිතුමා**

කමිටු සාමාජිකයින් බඳවා ගැනීමේදී කළයුතු කාරණාව පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

- **ගරු මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා**

පළාත් පාලන ආයතනවලින් ලබා දුන්නු පුහුණු අත්පොත හා පනත ප්‍රකාරව 12(11) වගන්තිය අනුව ප්‍රාදේශීය සභා සඳහා අදාළ කාරක සභා පත් කළ හැකි අතර මේ පනතට අදාළව කමිටු සමාජගත කිරීමේ අරමුණින් නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට පරිබාහරව සමාජ ක්‍රියාකාරකම් කරන, විෂය පිළිබඳව අවබෝධයක් තිබෙන, සමාජ ක්‍රියාකාරී පිරිසක් මේ කමිටු සඳහා පත් කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

- **ප්‍රාදේශීය සභා ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

මෙම කාරක සභා හතරටම ඒ ඒ ක්ෂේත්‍ර පිළිදව ප්‍රදේශය තුළ සිටින සභාවට ආදායම උත්පාදනය කර ගන්න පුළුවන් දැනුම හා නිපුණතාවය සහිත කණ්ඩායමක් ඇතුළත්කර ගැනිම සුදුසුයි.

**ගරු මන්ත්‍රී ඒච්.ඒම්.කරුණාරත්න මැතිතුමා**

ඒ අනුව කමිටු සඳහා සිවිල් නියෝජිතයින් ලෙස පහත නම් සඳහන් පුද්ගලයින් පත් කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

| අ:අ: | නම | ග්‍රාම නිලධාරි වසම | තනතුර | යෝජිත කමිටුව |
|---|---|---|---|---|
| 1 | ජේ.එම්.තිලක් ජයනාත් විජේසිංහ මයා | මැද ගෙදරගම | විශ්‍රාමික විදුහල්පති | මුදල් කමිටුව |

| | | | | |
|---|---|---|---|---|
| 2 | එච්.ටී.බී.පී.ජී.හේවගේ මයා | වැලිමඩ | සමාජ ක්‍රියාකාරී | මුදල් කමිටුව |
| 3 | නෂාප් කුලයිලුම් මයා | යල්පත්වෙල | ව්‍යාපාරික | මුදල් කමිටුව |
| 4 | එම්.සමන්ත පුෂ්පකුමාර මයා | නාවෙල | ගුරු වෘත්තිය | පරිසර කමිටුව |
| 5 | අමරකෝන් මන්ත්‍රී මයා | අබේවෙල වසම | ගැමිදිරිය ව්‍යාපෘතිය ගිණුම් පහසු කාරක | පරිසර කමිටුව |
| 6 | එම්.සමරනායක මයා | දිවිතොටවෙල | හිටපු කාර්මික නිලධාරි | නිවාස කමිටුව |
| 7 | එම්.අබේරත්න මයා | යල්කුඹුර | ජලසම්පාදන මණ්ඩල කළමනාකරු | නිවාස කමිටුව |
| 8 | එම්.නිමල් වීරවික්‍රම මයා | කොටකිතුල | විශ්‍රාමික සංඛ්‍යා ලේඛන නිලධාරි | කර්මාන්ත කමිටුව |
| 9 | එම්.කේ.සී.රත්නායක | කොටකිතුල | වෘත්තීය පුහුණු අධිකාරියේ ජ්‍යේෂ්ඨ උපදේශක | කර්මාන්ත කමිටුව |

- **ගරු මන්ත්‍රී ජේ.ඒම.ඉන්දික සම්පත් මැතිතුමා**

ඉදිරි සභාවාරයේදී හෝ ඊට පෙර කමිටු සඳහා නියෝජිතයින්ගේ නම් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා **ගරු මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මන්ත්‍රීතුමාගේ** නම ගරු මන්ත්‍රී **ජේ.ඒම්.මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා** යෝජනා කරන ලද අතර **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රවින්ද්‍ර ගුණසේකර මන්ත්‍රීතුමා** විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

සිවිල් පුද්ගලයින් මේ කමිටු සඳහා නම් කරන ලද්දේ පක්ෂ අදහසකින් නොවන අතර ඒ සඳහා සහභාගි වන කිසිදු පාර්ශවයකට ගෙවීමක් සිදු වෙන්නේ නැ.ඒ සියලුදෙනා ස්වෙච්ඡාවෙන් මැදිහත් වී කටයුතු කරනවා.

ඒ අනුව මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙම යෝජනාව 2025.06.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

**ගරු මන්ත්‍රිනී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිතුමිය**

1899 අංක 09 දරණ සුසානභූමි සහ භූමදාන ඉඩම් පිළිබඳ ආඥා පනතේ 19(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා අංක 07 හෙලිකොප්ටර්බල ගණයට අනුයුක්තව ගුවන් අවිකරුවෙකු ලෙස සේවය කළ වැලිමඩ, අමුණුමුල්ල,මහවංගිය පතන ,අංක 26 යන ලිපිනයේ පදිංචි ව සිටි ගුවන් අවිකරු 28242 බල පන්ති සැරයන් උදයකුමාර ඩබ්ලිව්.එම්.එස්.2025/05/09 වන දින මාදුරු ඔය ගුවන් අනතුරින් ජීවිතක්ෂයට පත්වීම හේතුවෙන් ඔහු මිහිදන් කළ මහතැන්න සුසානභූමියේ ස්ථිර සොහොන් කොතක් ඉදිකිරීමට ඔහුගේ බිරිඳ විසින් කළ ඉල්ලීම එකී පොදු සුසානභූමියේ අඩි 3×3 විශාලත්වය ඇති ඉඩම් කොටසක් වෙන් කර දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩී.එම්. පත්මිණී දිසානායක මිය** විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

මෙම යෝජනාව සඳහා මාගේ එකඟතාවය ලබා දෙන අතර නගරය ජනාකීර්ණ වීමත් සමඟම සුසානභූමි සඳහා වෙන් වී ඇති භූමි ප්‍රමාණය අඩු වී ඇත.ඒසේම සුසානභූමි සඳහා වෙන්ව ඇති අපේ සීමිත ඉඩම් ප්‍රමාණය ,අක්කරයක් හෝ අක්කර බාගයක් පමණ කොටසක් වන අතර ඒය ඉදිරියේදී අනාගතයට ඉතුරු විය යුතු බැවින් සුසානභූමි ඉදිකිරීම් ඉදිරියේ දි සිදු නොකර භූමදාන කටයුතු කරන ලෙස මා යෝජනා කරනවා.

- **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තුවාන් හාසිම් මැතිතුමා**

මෙම පුද්ගලයා රණවිරුවකු බැවින් ඒ යෝජනාව ඉටු කිරීමට සහය ලබා දෙන බව මා ප්‍රකාශ කර සිටිනවා.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙම යෝජනාව 2025.06.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය..

**06. ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද හදිසි යෝජනා**

**හදිසි යෝජනා අංක -01**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති උප සභාපති හා ගරු මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලාගේ 2025 ජූනි මස මන්ත්‍රී දීමනා වශයෙන් රු:570,000.00ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සභා අරමුදලින් දැරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටි.කේ.ලලිත් පද්මසිරි විජයන්ද මැතිතුමා** _විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා**

ජාතික ජනබලවේගේ මන්ත්‍රීවරු මන්ත්‍රී දීමනාව ගන්නෙ නැති බව සඳහන් විය.මේ නිසා මෙම මන්ත්‍රී දීමනා වශයෙන් රු:5,70000.00ක මුදලක් ගෙවීමට කටයුතු කර තිබෙන්නේ අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් 15 දෙනාටද නැත්නම් මන්ත්‍රීවරු 44 දෙනාටද යන්න දැන ගැනිමට අවශ්‍ය වන බැවින් පොඩි පැහැදිලි කිරීමක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

- **ගරු ප්‍රාදේශීය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි,මන්ත්‍රීතුමියනි සභාපතිතුමාට රු25,000.00ක්ද උප සභාපතිට රු20,000.00ක්ද ඒක් මන්ත්‍රීවරයෙක් සඳහා රු15,000.00 බැගින් දීමනාව හිමි වෙනවා.ජතික ජනබලවේගයේ මා සහ මගේ මන්ත්‍රීවරුන්ගේ දීමනාව සම්බන්ධව කනස්සල්ලට පත් නොවන ලෙස හා අප පක්ෂයයේ දිමනා බණ්ඩාරවෙල ලංකා බැංකුවේ මන්ත්‍රී වැටුප් ගිණුමට බැර වෙන අතර ඒ තුළින් පොදු ජනතාවට අදාළ සේවාවන් සිදු කරිමට බලාපොරොත්තු වෙනවා.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙම යෝජනාව 2025.06.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**හදිසි යෝජනා - 02**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දෛනික සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන් 36ක් සඳහා ජූනි මස දෛනික වැටුප් වශයෙන් රුපියල් 2,285,000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් දැරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඊ චන්දක වීරසේන මැතිතුමා** විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර එ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙම යෝජනාව 2025.06.26 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වාර්තා සලකා බැලීම**

ඒ අනුව **ප්‍රාදේශිය සභා මන්ත්‍රී මහේෂ් කෝසල මැතිතුමා** විසින් 2025.06.11 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ප්‍රකාශ කරන ලද අතර මෙකි වාර්තාවේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරිමට අනුමත කරන ලදි.

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා සභාගත කළයුතු වෙනත් ලේඛන**

ලැබීම් හා වියදම් පිළිබඳ 2025 මැයි මස මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභා විසින් පිළිගන්නා ලදි.

**08. ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස්**

පහත සඳහන් මන්ත්‍රීවරුන් විසින් ඔවුන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදි.

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හුසෙයින් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2025 ජූනි මස12 වන දින පැවැත්වූ ශ්‍රමදානය සංවිධානය කිරීම සඳහා කැපවූ සභාපතිතුමාට ස්තුතිය පුද කර සිටින අතර මෙහිදි වැලිමඩනගරයේ ජල මාර්ග ආශ්‍රිතව, හෝටල් ආශ්‍රිතව ගොඩක් පරිසරය දූෂණය වී ඇති බව දක්නට ලැබුණා.බොහෝ ව්‍යාපාරිකයන් ඔවුන්ගේ අවධානය පරිසරය ආරක්ෂා කිරීමට යොදා ගෙන නොමැති අතර එමඟින් ඩෙංගු මදුරුවන් බෝවීමට ඇති ඉඩකඩ වැඩිය.ඒසේම ගඟ ආශ්‍රිත ඉදි කිරීම්වල කණු දමා හෝටල් හා ගොඩනැගිලි ඉදිකිරීම් කර තිබෙන බැවින් මෙම ගොඩනැගිලි වලින් කසල බැහැර කිරීමේ දි ගැටළු මතුවෙලා තියෙනවා.ඒ නිසා මේ සඳහා සුදුස ක්‍රියා මාර්ග ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද නාගරික ප්‍රදේශවල පමණක් නොව ග්‍රාමීය ප්‍රදේශවලද මෙම ව්‍යාපෘති කරන ලෙස ඉල්ලීමක් කරන අතර වැලිමඩ අවට ඇති සෙහොන් බිම් වලද ප්‍රශ්න තිබෙනවා.

**2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා**

බෝගහකුඹුර නගරය වැඩිම ජන කොට්ඨාශයක් සිටින නගරයක් වන අතර එහි කසල බැහැර කිරීම සම්බන්ධවෙන් නිසි ක්‍රමවේදයක් නොමැත. එබැවින් පරිසරය විශාල ලෙස දූෂණයට ලක්වෙලා තියෙනවා.මේ නිසා

- අළුගොල්ල ගමේ කුණු කන්දක් ගොඩවී ඇති බැවින් ඒ පිළිබඳවත්,
- සතියකට එක් දිනක් පමණක් කසල එකතු කරන බැවින්, ගුරුතලාව නගරයේ විශාල ලෙස කුණු එකතු කිරිම විම පිළිබඳවත්,
- බෝගහකුඹුර, ගුරුතලාව නගරවලට කසල දැමීම සඳහා කසල බඳුන් යෙදවීමටත්,
- ගුරුතලාව ප්‍රදේශයට වීදී ලාම්පු ලබා දිම පිළිබඳවත්,

ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කර ඉදිරියේ දි සිදු කරන යෝජනාවලට ඇතුළත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත කුමාරන් මැතිතුමා**

පුහුල්පොල සිට කොස්කණුවෙල මාර්ගයේ වීදී ලාම්පු සවි කර ඇති අතර ඩයරබා පහළ කොටසට විදී ලාම්පු 03ක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම ඩයරබා පහළ කොටසේ ලැයිම් පේළි දෙක සඳහා වැසිකිළි පහසුකම් නැති නිසා ඒ සඳහා අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය**

ඩයරබා පහළ කොටසට විදි ලාම්පු නැති නිසා රාත්‍රී කාලයට ගමන් කිරිමට අපසුය.මේ නිසා විදි ලාම්පු ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර වැසිකිළි පහසුකම් නිසි අකාරයට නැති නිසා ගැහැණු ළමයින් මහත් අපහසුතායට පත් වි ඇති බැවින් ඒ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.තවද පුහුල්පොළ මාර්ගයටද වීදි ලාම්පු අවශ්‍යය.

**5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.ඒ.හාසිම් මැතිතුමා**

ගුරුතලාවේ නගරය සංවර්ධනය කල යුතුය. ඒ සඳහා මා හා මාගේ ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගය ලබා දෙනවා.ගුරුතලාව සංවර්ධනය කලහොත් සංචාරකයින් ද මෙම ප්‍රදේශයට ගෙන්වා ගත හැකිය.

**6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්දික සේනාරත්න මැතිතුමා**

ඡන්දය ලබා දුන් මාගේ බල ප්‍රදේශයේ ජනතාවට ස්තුතිය පුද කර සිටින අතර සභාව විසින් සභාව ගෙන එන ප්‍රගතිශිලි යෝජනා සම්බන්ධයයෙන් පක්ෂයක් ලෙස මා සහයෝගය ලබා දෙනවා.

**7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා**

ගරු සභාවේ කටයුතු කිරීමේදී කාලය පිළිබඳව සිතා බලා සභාපතිතුමාගේ බලතල පිළිබඳව දැනුවත්වී මන්ත්‍රීවරුන් ලෙස අපි අවබෝධයක් ලබා ගෙන අනවශ්‍ය ලෙස සභාවේ කාලය ගත නොකර කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිත්ති උසෙයිමා මැතිනිය**

පරිසර දිනය වෙනුවෙන් 2025.06.12 වන දින පැවැත් වූ ශ්‍රමදානයට මා සහභාගි වූ අතර මෙහි දි වැලිමඩ නගරය පිරිසිදු කරන සේවකයින්ගේ පිරිසිදු කිරිමේ කටයුතු පිළිබඳව අධීක්ෂණය කිරීමට කණ්ඩායමක් යෙදවිය යුතුය. එසේම ප්‍රජා සංවර්ධන වැඩසටහනක් හා ව්‍යවසායකත්ව වැඩසටහන් මගින් කාන්තා ආදායම් උත්පාදන ක්‍රම වැඩි දියුණු කිරිමටත් කටයුතු කරන ලෙස මා යෝජනා කර සිටිනවා.

**9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා**

වැලිමඩ, ඌව පරණගම ප්‍රදේශයේ ගොවීන්ගේ ප්‍රධානතම ආදායම් මාර්ගයක් වන්නේ අර්තාපල් වගාවයි. නමුත් අර්තාපල් සඳහා සාධාරණ මිලක් නැති නිසා ගොවීන් අර්තාපල් වගාවෙන් ඈත් වෙලා සිටිනවා. මේ නිසා ඔබතුමන්ලා සාධනීය ලෙස මැදිහත් වී අර්තාපල් මිල ඉහල නංවා ගැනිමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා**

සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025.06. 09 වන දින බොරලන්ද ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයට යොදා ගන්නා හානි දායක අපද්‍රව්‍ය ඉවත් කර ගැනිමේ වැඩසටහනක් ක්‍රියාත්මක වුණා.එයට සභාපතිතුමන්හට ස්තූති වෙන අතර අඹේවල වාරි ව්‍යාපෘතියෙන් කරන ලද ජල ඉල්ලීමට විරුද්ධවීම සාධාරණයි.ඒ වගේම සුසාන භූමි ගැන සේනාධිර මන්ත්‍රීතු කතා කලා.එතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා.

**12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා**

ඉදිරියේ දි පරිසරය පිරිසිදු කිරිමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන විට අපව දැනුවත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් පැමිණ සිටි සියලු දෙනාට ස්තුති කරමින් හා Clean Sri lanka වැඩසටහනට සහභාගි වු සියලු මන්ත්‍රීවරුන්ටත් ,කාර්ය මණ්ඩලයටත්,ප්‍රදේශයේ ජනතාවටත්,ව්‍යාපාරික මහතුන්ටත්,මාධ්‍යවේදී මහතුන්හට හා උපකාර කළ සියලු දෙනාට ස්තුතිය පුද කර සිටින ලදි.මීළඟ සභාව 2025 ජූලි මස 31 දින පැවැත්වෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙමින් සභාවේ වැඩ කටයුතු මධ්‍යහ්න 12.13 ට නිමා කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
වැලිමඩ

\

මෙම සභා වාර්තාව ................................................ වන දින පැවති මහ සභාවේ දි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීනි ....................................................................මැතිතුමා/මැතිනියගේ යෝජනාවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීනි..................................................... මැතිතුමා/මැතිනියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/බහුතර ඡන්දයෙන් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය